# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1947/46 - 2016 ජනවාරි මස 01 වැනි සිකුරාදා - 2016.01.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත**

5 වන වගන්තිය යටතේ නියෝගය

2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 5 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය රවි කරුණානායක වන මම, මෙම නියෝගය මගින්, එම වගන්තිය යටතේ 2014 නොවැම්බර් මස 21 වැනි දින අංක 1889/48 දරන *අති විශේෂ ගැසට් නිවේදනය* මගින් අවසන් වරට සංශෝධිත 2006 ඔක්තෝබර් 05 වැනි දින අංක 1465/20 දරන *අති විශේෂ ගැසට් නිවේදනය* මගින් ප්‍රකාශයට පත් කරන ලද නියෝගය පහත උපලේඛනයේ දැක්වෙන පරිදි සංශෝධනය කරමි.

රවි කරුණානායක,
මුදල් අමාත්‍ය.

2015 දෙසැම්බර් මස 31 දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

මෙම උපලේඛනයේ 33 වැනි අයිතමයට පසුව ඉනික්බිතිවම පහත සඳහන් නව අයිතමය එකතු කිරීම මගින් :-

"34. 2016 ජනවාරි 01 දිනට පසුව ආරම්භ වන යම් කාල පරිච්ඡේදයක් තුළ ඇතුළත් වූ සෑම ණය කාඩ්පතක ගනුදෙනුවක් සම්බන්ධයෙන්, යම් විදේශ ව්‍යවහාර මුදලකින් කාඩ්පතක් ඉදිරිපත් කරන හෝ ඉදිරිපත් නොකරන ගනුදෙනුවක් යන්න පිළිබඳව සැලකිල්ලට නොගෙන එහි වෙළඳ රට (භාණ්ඩ හෝ සේවා මිලදී ගැනීම හෝ මුදල් ආපසු ගැනීම් සිදුවන රට) ශ්‍රී ලංකාව වන අවස්ථාවක දී ගෙවිය යුතු වන යම් මුදල් ප්‍රමාණයක් ගෙවීම සඳහා හිමිකම් පෑමක්, ඉල්ලීමක් හෝ අයැදීමක්

35. යම් සමාගමක යම් කොටස් සංඛ්‍යාවක් නිකුත් කිරීමක්, මාරු කිරීමක් හෝ පැවරීමක් මත නිකුත් කළ යම් කොටස් සහතිකයක්"

01 - 622


1A - PG 2755 — 106 (2016/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*